**කැලණිය විශ්වවිද්‍යාලය - සමාජීය විද්‍යා පීඨය**

**ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධි දෙවන වසර**

**2016/2017 අධ්‍යයන වර්ෂය - දෙවන අර්ධ වාර්ෂික පරීක්ෂණය**

**(2019 ජනවාරි)**

**ක්‍රීඩා සහ විශ්‍රාන්ති කළමනාකරණය**

**SRMG 32494: ඔලිම්පික් ව්‍යාපාරය හා ඔලිම්පික් දර්ශනය**

**ප්‍රශ්න 04කට පමණක් පිළිතුරු සපයන්න.**

**ප්‍රශ්න සංඛ්‍යාව : 06 යි.** **කාලය : පැය 03යි.**

01. පුරාණ ඔලිම්පික් උළෙල (Ancient Olympics Festival), ග්‍රීක පෞර රාජ්‍යයන්හි පැවති දේශපාලනික (Political) සහ වාණිජමය (Commercial) සාධක මගින් බලපෑමට ලක් වූ ආකාරය නිදර්ශනාත්මකව පැහැදිලි කරන්න.

02. ඔලිම්පික් වටිනාකම් (Olympic Values) මොනවාදැයි හඳුන්වා, ඔලිම්පික් වටිනාකම් සමාජගත කිරීමට ජාත්‍යන්තර ඔලිම්පික් කමිටුව (International Olympic Committee) ගෙන ඇති පියවරයන් මොනවාදැයි නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

03. "ඔලිම්පික් ක්‍රීඩා උළෙල (Olympic Games) මගින්, ඔලිම්පික් ව්‍යාපාරයෙහි (Olympic Movement) වඩාත් දෘෂ්‍යමාන පැතිකඩයන් විද්‍යාමාන කරයි" ඉහත ප්‍රකාශය නූතන ඔලිම්පික් ව්‍යාපාරය හමුවේ ඇති අභියෝග ඇසුරින් විමසන්න.

04. ජාත්‍යන්තර ඔලිම්පික් කමිටුව (International Olympic Committee) විසින් හඳුන්වාදෙන ලද ඔලිම්පික් වටිනාකම් පිළිබඳ අධ්‍යාපනික වැඩසටහන (Olympic Values Education Programme), පාසැල් ක්‍රීඩා කණ්ඩායමක් සඳහා ක්‍රීඩා කළමනාකරුවෙකුට යොදා ගත හැකි ආකාරය විස්තර කරන්න.

05. “ඔලිම්පික් ප්‍රඥප්තිය (Olympic Charter) ඔලිම්පික් ක්‍රීඩාවෙහි ව්‍යවස්ථානුකූල ස්වාභාවය දක්වන මූලික මෙවලමකි”

i. ඔලිම්පික් ප්‍රඥප්තිය යනු කුමක්දැයි හඳුන්වා, එහි සඳහන් ජාත්‍යන්තර ඔලිම්පික් කමිටුවේ මෙහෙවර ( Mission) සහ භූමිකාව ( Role) විස්තර කරන්න.

ii. ඔලිම්පික් ප්‍රඥප්තියේ ව්‍යවස්ථාවක්/ පරිච්ඡේදයක් තුළ ඇතුළත් අතුරු ව්‍යවස්ථාවක් (Bye-law) තෝරාගෙන, එය ඔලිම්පික් ක්‍රීඩාවේ ප්‍රගමනය උදෙසා දායක වන ආකාරය නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

06. තිරසාර සංවර්ධන ඉලක්ක ඉටුකර ගැනීමේදී 2020 ඔලිම්පික් න්‍යාය පත්‍රයේ (Olympic Agenda 2020) හතරවන නිර්දේශයේ (Recommendation 04) භාවිතය පිළිබඳව විවේචනාත්මක විග්‍රහයක යෙදෙන්න.